**ශ්‍රී ලංකා කුදෝ සම්මේලනය - 2022**

**-------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1. මතය ව්‍යාවනය

ශ්‍රී ලංකා කුදෝ සම්මේලනයේ (“සම්මේලනය”) 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් සහ වියදම් ගිණුම, මුදල් ප්‍රවාහ ප්‍රකාශය, හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

සම්මේලනයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මම මතයක් ප්‍රකාශ නොකරමි. මෙම වාර්තාවේ 1.5 ඡේදයේ විස්තර කර ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීම සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

### 1.2 මතය ව්‍යාවනය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය ව්‍යාවනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ විගණන විෂය පථය යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන සුළු හා මධ්‍ය පරිමාණ ආයතන සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සම්මේලනයේ අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සම්මේලනය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සම්මේලනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සම්මේලනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව, සම්මේලනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 **විගණන විෂය පථය**

මාගේ වගකීම වන්නේ ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්ට අනුකූලව සම්මේලනයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණනයක් සිදුකර වාර්තාවක් නිකුත් කිරීමයි. කෙසේවෙතත්, මතය ව්‍යාවනය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවල බලපෑම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මතයක් ඉදිරිපත් කිරීම සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.5.1 ගිණුම්කරණ අඩුපාඩු**

| විගණන නිරීක්ෂණ | කළමනාකරණයේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|
| (අ) රු. 350,800 ක් වටිනා දේපල පිරියත සහ උපකරණ සම්පූර්ණයෙන්ම ක්ෂය වී ඇතත්, එම වත්කම් තවමත් භාවිතයේ පවතී. ඒ අනුව, ජංගම නොවන වත්කම්වල ඵලදායි ජීව කාලය වාර්ෂිකව සමාලෝචනය කර නොතිබුණි. | 2023 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව සකස් කළ යුතුය. |
| (ආ) 2021 වර්ෂය තුළ අධි ප්‍රතිපාදන ලෙස සිදු කරන ලද විගණන ගාස්තුව රු. 9000 ක් පූර්ව වර්ෂයේ ගැලපීම ලෙස සමුච්චිත අතිරික්තයට ගැලපීමකින් තොරව සමාලෝචිත වර්ෂයේ වියදමට බැර කර තිබුණ බැවින් වර්ෂය තුළ වියදම් අඩුවෙන් දක්වා ඇත. | 2023 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | -එම- |
| (ඇ) සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.39,955 හි අලාභය සහ ඊට අනුරූප පෙර වර්ෂයේ අලාභය රු.40,615 කි. සම්මේලනයේ ජංගම වගකීම් එහි ජංගම වත්කම් රු. 96,754 කින් ඉක්මවා ඇති අතර මුළු වගකීම් එහි මුළු වත්කම් රු. 81,254 කින් ඉක්මවා ඇත. එසේම, සමාලෝචිත වර්ෂයේ සම්මේලනයේ මුළු වත්කම් හා සසඳන විට, සමුච්චිත අරමුදලේ සෘණ ශේෂය 5 ගුණයක් විය. මෙයින් ඇඟවෙන්නේ, සම්මේලනය ඉදිරියට පවත්වාගෙන යාමට ඇති හැකියාව පිළිබඳව සැලකිය යුතු සැකයක් ඇති කළ හැකි ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් පවතින බවයි. කෙසේ වෙතත්, ප්‍රතිකර්ම ක්‍රියාමාර්ග ගැනීමට සහ මූල්‍ය ප්‍රකාශන වල අවශ්‍ය හෙළිදරව් කිරීම් සිදු කිරීම සඳහා විධායක කමිටුව මෙම තත්ත්වය සැලකිල්ලට ගෙන නොතිබුණි. | සම්මේලනයේ අදහස් ඉදිරිපත් කර නොතිබුණි | සම්මේලනය ඉදිරියට පවත්වාගෙන යාමට ඇති හැකියාව පිළිබඳව ඇති කළ හැකි ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවය අවම කර ගැනීමේ සැලසුම් ක්‍රියාවට නැංවීමට සහ මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය හෙළිදරව් කිරීම් සිදු කිරීමට කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතුය. |

**2.** **මූල්‍ය සමාලෝචනය**

**2.1** **මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 39,955 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 40,615 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 660ක වර්ධනයක් නිරීක්ෂණය විය. මුළු වියදම් රු. 23,360 කින් අඩු වීම මෙම වර්ධනය සඳහා හේතු විය.

**3.** **මෙහෙයුම් සමාලෝචනය**

**3.1** **මෙහෙයුම් අකාර්යක්ෂමතාව**

| විගණන නිරීක්ෂණ | කළමනාකරණයේ අදහස් දැක්වීම් | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේදී සහ ඊට පෙර වසර තුළදී සම්මේලනය දේශීය හා ජාත්‍යන්තර ක්‍රීඩා ඉසව් සංවිධානය කර නොතිබුණි. | සම්මේලනයේ නාමය වෙනස් කරන තුරු දේශීය හා ජාත්‍යන්තර වශයෙන් කිසිදු ඉසව්වක් සංවිධානය නොකරන බව ක්‍රීඩා අධ්‍යක්ෂ ජනරාල්වරයාට දන්වා ඇත. | ක්‍රීඩා ඉසව් ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුයි. |